# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2154/9 - 2019 දෙසැම්බර් මස 18 වැනි බදාදා - 2019.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* DS/VN/L.A.A/MSJ-232.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/5/2018/HA/04.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන පරවශතාවයේ විස්තර:*

| | |
|---|---|
| පළාත | : උතුර |
| දිස්ත්‍රික්කය | : යාපනය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : මාවිට්ටපුරම් දකුණ (J/232) |
| ගම | : මාවිට්ටපුරම් |
| මූලික පිඹුරු අංකය | : පිපියා 2936 |
| හේතුව | මාවිට්ටපුරම් දකුණ ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා (J/232) (ග්‍රාම ලේකම් කාර්යාලය) |

**කැබලි අංක 1**

ඉඩමේ නම: පුලියඩි; ඉඩමේ විස්තරය: වත්තේ ගොඩනැගිල්ල හා වැසිකිලි වල හා නළ ළිදක්; හිමිකම් කියන අය: සෙල්වරාසා අජිත්කුමාර්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0180.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 පෙබරවාරි මස 10 වැනි දින පෙ. ව. 10.00 ට තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2020 ජනවාරි මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී

1A - G31638 – 22 (2019/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ස.සිවශ්‍රී,
ප්‍රාදේශීය ලේකම්,
තෙල්ලිප්පළෙ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වලිකාමම් උතුර,
තෙල්ලිප්පළෙ.
2019 දෙසැම්බර් මස 09 වැනි දින,ි

12-892

ශුද්ධිපත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* DIVPANN/LND/ACDEP/1/4/15.

2019 මැයි මස 10 වැනි දිනැති අංක 2122/55 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීමේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ගොනු අංකය 4-3/2017/Lo/283 යනුවෙන් සඳහන් වී ඇතත් එය 4-3/4/2017/Lo/54 වශයෙන් නිවැරදි විය යුතුය.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

12-893